www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ට්‍රොට්ස්කිගේ "දැවැන්ත හා චිරකාලීන ඓතිහාසික වැදගත්කම" ආරක්ෂා කිරීම සඳහා

## In defence of Trotsky's "imense and enduring historical significance"

**ඩේවිඩ් නෝර්ත්**

**2010 පෙබරවාරි 04**

*මෙහි පහත පලවන්නේ 2010 පෙබරවාරි 03 දින ඕස්ට්‍රේලියාවෙ සිඩ්නි නගරයේ ග්ලීබුක්ස් පොත්හලේදී,* In Defence of Leon Trotsky: A Reply to the Falsifications of Robert Service *(ලියොන් ට්‍රොට්ස්කි ආරක්ෂා කිරීම සඳහා රොබට් සර්විස්ගේ මුසාකරනයන්ට පිලිතුරක්) යන තම කෘතිය එලිදක්වන අවස්ථාවේ, ලෝක සමාජවාදී වෙබ් අඩවි කර්තෘ මන්ඩලයේ සභාපති හා එක්සත් ජනපදයේ සමාජවාදී සමානතා පක්ෂයෙහි ජාතික සභාපති ඩේවිඩ් නෝර්ත් පලකල අදහස්ය.*

පසුගිය සතියේ ලංඩන් නුවර ෆොයිල්ස් බුක්ස් ආයතනයේ අනුග්‍රහයෙන් පැවති උත්සවයකදී, මහාචාර්ය රොබට් සර්විස් දේශනයක් පැවැත්වීය. ට්‍රොට්ස්කි පිලිබඳව තමන් රචනා කල චරිතාපදානය, සමාජවාදී සමානතා පක්ෂය විසින් දියත්කර ඇති විරෝධතා ව්‍යාපාරයක විෂය බවට පත්ව තිබෙන බවත්, ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නගරයේ පැවැත්වෙන එහි රැස්වීම ද ඇතුලුව, ලෝකය පුරා පැවැත්වෙන ප්‍රසිද්ධ රැස්වීම් වලදී සිය කෘතිය විවේචනයට ලක්වෙමින් තිබෙන බවත්, සිහිපත් කරමින් ඔහු මෙසේ පැවසීය.

"පසුගිය මාස දෙක තුන ඇතුලත ට්‍රොට්ස්කිවාදී කට්ටිවාදීන් සමඟ මට බොහෝ ගැටලු වලට මුහුනපෑමට සිදුව තිබේ. මන්ද යත් මා ට්‍රොට්ස්කි පිලිම වන්දනාවේ නොයෙදෙන බැවිනි. මම ට්‍රොට්ස්කිගේ පූජාසනය ඉදිරියේ වන්දනාමාන නොකරමි.

"පිලිම භක්තිකයන්" ලෙස සර්විස් චෝදනා කරන්නේ අපට පමනක් නොවේ. ට්‍රොට්ස්කි පිලිබඳ වැදගත් චරිතාපදාන කතුවරුන් වන අයිසැක් ඩොයිස්චර් හා පියෙරි බෲවේ යන දෙදෙනාට එරෙහිව ද ඔහු මේ චෝදනාව සිය චරිතාපදානයේ මුල් පිටුවල ලියා ඇත. සර්විස්ට අනුව ට්‍රොට්ස්කිගේ ප්‍රධාන "පිලිම භක්තිකයා" ඩොයිස්චර්ය. බෲවේ සම්බන්ධයෙන් ගත් කල, ඔහු " ට්‍රොට්ස්කිගේ පූජාසනය ඉදිරියේ වැඳ වැටුනේය."

"පිලිම භක්තිකයා" හා "ට්‍රොට්ස්කිගේ පූජාසනය ඉදිරියේ වැඳ වැටීම" යන වචන යොදාගැනීමෙන් ගම්‍ය වන්නේ, ට්‍රොට්ස්කි අර්ධ-ආගමික හෝ නිකායක මෙන් පිදුම් ලත් විෂය වූ බවයි. ඔහු පරිසිද්ධීන් හා තර්කයට නිර්මුක්තවූ බුද්ධි හීන, මිත්‍යා දෘෂ්ටිකයන් විසින් වන්දනාමාන කරනු ලබන "මූර්තියකි," එනම්, "ව්‍යාජ දෙවියෙකි." මෙය වනාහි මුට්ටිය, කේතලය කලු බව පවසනවාක් වැනි දෙයකි. ට්‍රොට්ස්කි ජීවත්ව සිටි අවධියේ සන්දර්භය තුල ඔහු ගැන විමර්ෂනයක යෙදිය යුතු වුවත්, අව්‍යාජ ඓතිහාසික වැදගත්කමක් දැරූ අයෙකු ලෙස ඔහු සැලකිල්ලට ගැනීමට අපොහොසත් බව පෙන්වා ඇත්තේ අන් කවරෙකුවත් නොව සර්විස්මය. කෙසේ වෙතත්, සර්විස් ට්‍රොට්ස්කිට සලකන්නේ, වැඳුම් පිදුම් කල යුතු දෙවියෙකු ලෙස නොව, මන්තර ගුරුකම් මඟින් පලවා හැරිය යුතු යක්ෂයෙකු ලෙසිනි.

මෙසේ පලවා හැරීමට නම් ට්‍රොට්ස්කි, මිනිස් කමින් තොර, ගලවාගත හැකි කිසිදු ලක්ෂනයකින් තොර, යක්ෂයෙකු ලෙස හෙලිදරව් කිරීම අවශ්‍යය. ඔහු කෲර, අධම, උද්ධච්ච, ආත්මාර්ථකාමී පුද්ගලයෙකි. සාක්ෂාත් කරගත නොහැකි මනෝ රාජ්‍යයක් පසුපස යක්ෂාවේශයෙන් හඹා යාමේදී, මනුෂ්‍ය වර්ගයා ගිනි ජාලාවක කොටුකර තැබීමට සූදානම්, ආත්මයෙන් තොර ගනක යන්ත්‍රයකි. එපමනක් ද නොවේ. සර්විස් හඳුන්වාදෙන ට්‍රොට්ස්කි වනාහි, සිය පියාගේ විශ්වාසය හා භෞතික කාර්ය සිද්ධීන් අවඥාවෙන් බැහැර කල අකෘතඥ පුත්‍රයෙකි. එසේම ඔහු, තම පලමු බිරිඳ ආවාට ගියාට ගැබ් ගන්වා අතරමං කල, විශ්වාසය කඩකල, ස්වාමි පුරුෂයෙකි. සිය දේශපාලන ග්‍රස්තියේ ප්‍රතිවිපාකයක් ලෙස, සිය දූ දරුවන් දුක් වේදනාවන්ට හා මරනයට අතහැර දැමීම පිලිබඳව අවසාන වශයෙන් වගකිව යුතු නොසැලකිලිමත් හා කට්ටි පැනපු පියෙකි. (කට කතාවලට අනුව) බ්‍රිතාන්‍ය මූර්ති ශිල්පිනියකට හාදකම් දැක්වූ ද තමා හා බිරිඳ වයස පනස් ගනන් පසුකරමින් සිටි අවධියේ, ලිංගික හැසිරීම් විස්තර කරමින් ඇය වෙත ලිපියක් පවා යැවූ, ලිංගික සල්ලාලයෙකි.

සර්විස් තව දුරටත් කියා සිටින්නේ, කිසිවක් නොදන්නා විෂයන් පිලිබඳව ලියමින් ට්‍රොට්ස්කි, බුද්ධිමතෙකු ලෙස පෙනී සිටි බවයි. ඔහු

බොරුකාරයෙකු හා වංචනිකයෙකු ද විය. කෙටුම්පත් ගනනාවකින් සැදුම්ලත් චරිතාපදානයක් ලිවූ ඔහු, තමා පිලිබඳව වංචනික ලෙස ගොඩනගාගත් ප්‍රසිද්ධ ප්‍රතිරූපය කෙලසීමට හේතුවන සෑම කරුනක්ම ක්‍රමානුකූලව මකා දැමීය. ඉතා වැදගත් තොරතුරු අතුරින් ලසුකොට දැක්වීමට ට්‍රොට්ස්කි උනන්දුවක් දැක්වූ කාරනය නම්, -සර්විස්ට අනුව- ඔහු යුදෙව්වෙකු වීමයි.

සිය යුදෙව් පසුබිම යටපත් කිරීමට දරන ලද මෙම ප්‍රයත්නය, ට්‍රොට්ස්කිගේ ජීවිතයට එබී බැලීමට යතුර සපයන්නේ යයි සර්විස් තර්ක කරයි. තරුන "ලීබා" බ්‍රොන්ස්ටයින් රුසියානුකරනයවූ "ලෙව්" බ්‍රොන්ස්ටයින් බවට පරිවර්තය වීම, මෙම තරුනයාගේ ජීවිතයේ තීරනාත්මක සන්ධිස්ථානය වශයෙන් සර්විස් ගෙනහැර දැක්වීය. පලමු නාමයේ වෛරයට පාත්‍රවූ යුදෙව් හඬ, ඉවතලෑමෙන් පසුව, තෙමේම සොයාගැනීමේ නාටකයට අවසානයේදී වේදිකාව සකස් විය. එනම් ලෙව් ඩෙවිඩොවිච් ට්‍රොට්ස්කි නිර්මානය කිරීමයි! සර්විස් ලියන බොහොමයක් දෑ මෙන්ම මෙම කථාන්තරය පිලිබඳව ද පැන නඟින ගැටලුව වන්නේ, එය කරුනු කාරනා වශයෙන් පදනම් විරහිත වීමයි. උත්පත්තියේ සිටම බ්‍රොන්ස්ටයින් හඳුන්වන ලද්දේ, "ලෙව්" නැතහොත් "ලියෝවා" යන කෙටි නාමයෙනි.

සර්විස්ගේ කෘතිය අපහාස වලින් පිරී වට්ටෝරුවකි: "ට්‍රොට්ස්කි ඝෝෂා කාරයෙකු හා තමන් ගැනම දොඩවන්නෙකි. ඔහු සැබවින්ම කෙතරම් පුහුමානී හා ආත්මීයත්වයට නැඹුරුවූ පුද්ගලයෙකු වීදැයි වටහා ගැනීමට මිනිසුන්ට වැඩි කලක් බලා සිටීමට සිදුවූයේ නැත." "ඔහු තම සිතැඟි පරිදි කටයුතු කරන්නෙකු බව, ඔහු සමඟ ජීවත් වන ඕනෑම ගැහැනියකට පිලිගැනීමට සිදුවිය. සෑම විටම ඔහු ලිව්වේ ඔහුගේ සිතට නැඟුනු දේය. බුද්ධිමය වශයෙන් එක් මාතෘකාවකින් තවෙකකට ලුහුටා ගිය ඔහු තුල, තම සිතුම් පැතුම් ක්‍රමානුකූල කිරීමට උත්තේජනයක් නොවීය. ඔහු බුද්ධිමය අපූර්වත්වයකට හිමිකම් නොකීවේය. එසේ කිරීමට ඔහු උත්සාහ කලේ නම්, නියත වශයෙන්ම ඔහු අවඥාවට ලක් වනු ඇත."

ට්‍රොට්ස්කි සිය උරුමය වෙනස් කිරීමට කොතෙක් උත්සාහ කර තිබුනත්, ඔහුගේ යුදෙව් වාර්ගිකත්වයේ සලකුන සර්විස් සෑම තැනකදීම දැකගත්තේය. ට්‍රොට්ස්කි "සිය දක්ෂකම් සම්බන්ධයෙන් අසංවර විය. ඔහු තම මතය නොවලහා ප්‍රකාශ කරන්නෙකි. කිසිවෙකුට ඔහු බියවැද්දිය නොහැකි විය. අනෙකුත් බොහෝ යුදෙව්වන්ට වඩා ට්‍රොට්ස්කි තුල මේ ගති ලක්ෂන ඉහල මට්ටමකින් පිහිටා තිබුනි..." "තමන්ගේම වැඩි දියුනුව සඳහා අවස්ථාවන් දෘෂ්‍යමාන ලෙසම භුක්ති විඳි එකම යුදෙව්වා ඔහු නොවීය...." මාක්ස්වාදය වෙත ට්‍රොට්ස්කිගේ ආකර්ෂනයේ මූලයන් සම්බන්ධයෙන් ගත් කල, සර්විස් අවධාරනය කරන්නේ, "ටෝරා හෙවත් මෝසස්ගේ නීතියෙහි දැඩි හික්මීම තුලින් පුහුනුව ලත් තරුන තරුනියන් මාක්ස්වාදී ව්‍යාකූලතාවන් තුල අනුරූපී සාධර්මිකතාවක් සොයාගත්" බවයි. "කෙස් පැලෙන තර්ක විතර්ක මාක්ස්වාදය හා යුදෙව්වාදය යන දෙකටම පොදු විය."

බොල්ශෙවික් පක්ෂය ට්‍රොට්ස්කිට යෝග්‍ය නිවහනක් සැපයීය. "පක්ෂ නායකත්වය, යුදෙව් කල්ලියක් ලෙස පුලුල් වශයෙන් හඳුනාගෙන තිබුනි." "යුදෙව්වන් බොල්ශෙවික් පක්ෂයේ ආධිපත්‍ය ඉසිලීම, සැබවින්ම පුලුල් ලෙස චෝදනාවට ලක්වූ බවට" මතයක් පැතිර තිබුනේ යයි තවදුරටත් සර්විස් සිය පාඨකයින් දැනුවත් කරයි. එහෙත් ට්‍රොට්ස්කි සියලුම යුදෙව් ආකෘතිකයින්ට අනුකූල වූයේ නැත. ඔහුගේ ඡායාරූප එකතුවේ ඇති "ලීබා ට්‍රොට්ස්කි-බ්‍රොන්ස්ටයින්ගේ" විරූපී නාසි විකට චිත්‍රයක් ද ඇතුලු කරමින් පාඨකයාට උපකාරී වන මෙවන් කොටසක් සර්විස් යොදා ගනියි. "ඇත්ත වශයෙන්ම ඔහුගේ සැබෑ නාසය දිගු හෝ වක් ව නොපිහිටි අතර, ඔහුගේ කුඩා යටි රැවුල විසිරෙන්නට හෝ හිසකෙස් අවුල් වීමට ඔහු ඉඩ හැරියේ නැත."

මේ දහජරාව මධ්‍යයේ ට්‍රොට්ස්කිගේ දේශපාලන මතවාද හා ඔහුගේ ලිපි ලේඛන සම්බන්ධයෙන් සර්විස්ට කීමට ඇත්තේ කුමක් ද? කෙටියෙන් පිලිතුර, කිසිවක් නැති තරම්ය යන්නයි. සැබවින්ම සර්විස් අවධාරනය කරන්නේ, ට්‍රොට්ස්කිගේ ලිඛිත හා වාචික වදන් හෝ ඔහුගේ ප්‍රසිද්ධ කටයුතු පවා, සිය චරිතාපදානයේ නාභිය බවට පත් නොකිරීමට අදිටන් කරගෙන සිටි බවයි. "මූර්ති භක්තිකයා" වූ ඩොයිස්චර්ට හා "පුදසුන වන්දනාමාන කල" බෘවේට ප්‍රති පක්ෂව සර්විස් කියා සිටින්නේ, "ට්‍රොට්ස්කි කථා කිරීමට හෝ ලිවීමට තෝරාගත් දේ මෙන්ම, ඔහු නිහඬතාවය රැකි දෑ පිලිබඳව ද හරියාකාරව පෙන්වා දීම වැදගත් බවයි. ප්‍රකාශිත නොකල ඔහුගේ මූලික උපකල්පනයන් ඔහුගේ ජීවිතයේ මිශ්‍රනයට ඒකාග්‍ර විය."

විශේෂයෙන්ම ඔහු ජීවත්ව සිටි කාලයේ විසූ ශ්‍රේෂ්ඨතම යුරෝපීය ලේඛකයා වශයෙන් පුලුල් ලෙස පිලිගන්නා ලද (නිදසුනක් ලෙස බර්ටෝල් බ්‍රෙෂ්ට් විසින්) පුද්ගලයෙක් සම්බන්ධයෙන් චරිතාපදාන කතුවරයෙකු ගෙන ඇත්තේ කෙතරම් අසාමාන්‍ය ප්‍රවේශයක් දෞ සිය මාතෘකාව බවට පත්වූ පුද්ගලයා ලිවූ කිවූ හා කල කී දේ තරමටම, ඔහු විසින් නොකී හා නොකලදේ ද වැදගත් වන්නේ යයි චරිතාපදාන කතුවරයෙකුට කෙසේ නම් ප්‍රකාශ කල හැකි ද? ඒවා බැරෑරුම්ව සැලකිල්ට ගෙන ඇතැයි අපේක්ෂා කල හැක්කේ කෙසේ ද?

එසේ ද වුවුත්, මේ අභූත සංකල්පය සර්විස්ගේ අරමුනට නම් කේන්ද්‍රීය වේ. ට්‍රොට්ස්කිගේ දැවැන්ත ශාස්ත්‍රීය නිර්මාන සම්භාරය ඔහු පිලිබඳව තක්සේරුවක් කරගැනීම සඳහා විශේෂයෙන්ම, ඩොයිස්චර් හා බෘවේ

යන චරිතාපදාන කතුවරුන්ට අවශ්‍යවූ බුද්ධිමය හා දේශපාලනික පදනම සම්පාදනය කල අතර, ඔවුන්ට එරෙහිව සර්විස් දක්වන වෛරය, ඉහතකී අභූත සංකල්පයෙන් පැහැදිලි කෙරෙයි. එය, සර්විස් ප්‍රතික්ෂේප කරන ප්‍රවිෂ්ටයකි. එසේ වීමට පාදක වන හේතු, ඓතිහාසික විධික්‍රමයට වඩා සමකාලීන දේශපාලන උත්සුකයන් සමඟ බැඳී තිබේ.

සිය කෘතියේ හා ප්‍රසිද්ධ ප්‍රකාශන ගනනාවකින් සර්විස්ම පිලිගෙන ඇති පරිදි, හෙතෙම සිය චරිතාපදානය ලියා ඇත්තේ, 1954 හා 1963 අතර කාලයේ පලකරන ලද, 'සන්නද්ධ අනාගත වක්තෘ, නිරායුධ අනාගත වක්තෘ හා පිටුවහල් කල අනාගත වක්තෘ' යන ඩොයිස්චර්ගේ තුන් ඈඳියේ කල්පවත්නා බලපෑම අඩාල කිරීම සඳහාය. 1960 හා 1970 දශකයන්හි සිය දේශපාලන සම්බන්ධකම් ගැන සර්විස් අපට කිසිවක් නොකියයි. (ඔහු ට්‍රොට්ස්කිවාදයට ගොරතර සතුරුකම් පෑ බ්‍රිතාන්‍ය කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයෙකුව සිටි බවට හෝ එහි පර්යන්තයේ කරක් ගසමින් සිටි බවට හෝ පැවති කටකථාවල සත්‍යයක් තිබුනේ දැයි අවස්ථාවක් ලැබුනේ නම් මම මහාචාර්ය සර්විස්ගෙන් ප්‍රශ්න කරන්නෙමි.) එහෙත් එම කාල වකවානුව තුල ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයන්ගේ ඉමහත් වර්ධනයෙන් ඔහු සිත්තැවුලට පත් නොවූයේ නම්, පැහැදිලි ලෙසම කෝපයට පත් විය. මෙම වැදගත් දේශපාලන ප්‍රපංචය කෙරේ ඩොයිස්චර්ගේ චරිතාපදානය සැලකිය යුතු අන්දමකින් දායකවූ බව පුලුල්ව හා සාධාරන ලෙස විශ්වාස කෙරෙයි. ඩොයිස්චර්ගේ තුන් ඈඳිය යුරෝපයේ, එක්සත් ජනපදයේ හා මෙයට ඕස්ට්‍රේලියාවේ ද යන්න එකතු කරන්නම්, පෙරලිකාරීවූ දහස් ගනන් තරුනයන්ට ලියොන් ට්‍රොට්ස්කිගේ ජීවිතය හා අදහස් කෙරේ ආරම්භක හැඳින්වීම සම්පාදනය කල බවට සැකයක් තිබිය නොහැකිය.

ට්‍රොට්ස්කි උපන් වර්ෂයවූ 1879 සිට සිවිල් යුද්ධය අවසන්වූ 1921 දක්වා කාලය අවරනය කල ඩොයිස්චර්ගේ *The Prophet Armed* (සන්නද්ධ අනාගත වක්තෘ) යන චරිතාපදානය පලවන විට ට්‍රොට්ස්කිගේ කීර්තිය, ස්ටැලින්වාදීන්ගේ මුසාවාදවලින් පිරි අභූත සංකල්පමය ව්‍යුහයට යටවී වැලලී තිබුනි. මුසාකරනයේ හා අවලාද නැගීමේ ඒසා පරිමාන දුෂ්ඨ ව්‍යාපාරයක ගොදුරක් බවට පත්වූ තවත් පුද්ගලයෙකු 20 වන සියවසේ, සමහර විට ලෝක ඉතිහාසය තුලම නොසිටියේය. සෝවියට් තන්ත්‍රයේ හා ලොව පුරා ස්ටැලින්වාදීන්ගේ අත යට පැවති පක්ෂ වල මුලුමනින්ම පාහේ සීමාන්තික සම්පත් කැපකරන ලද්දේ, සෝවියට් විරෝධී කඩාකප්පල්කාරියෙක්, ත්‍රස්තවාදියෙක් හා ෆැසිස්ට් ඒජන්තයෙක් ලෙස ට්‍රොට්ස්කි හෙලාදැකීම සඳහාය. සෝවියට් සංගමය තුල ඔහුගේ, හිටපු හා තවමත් සිටි සමචින්තකයින්, ක්ෂමා විරහිතව මුලුමනින්ම වනසා දමන ලදී. ස්ටැලින්වාදී තන්ත්‍රය විසින්, ට්‍රොට්ස්කිගේ සොහොයුරන්, බෑනා වරුන්, ලේලීන්, මස්සිනාවරුන් හා පුතුන් දෙදෙනා ද ඇතුලුව, බ්‍රොන්ස්ටයින් පවුලේ සියලු සාමාජිකයන්ම පාහේ මරා දමනු ලැබිනි. සමූහ ඝාතනවලට පෙර වසරවල පවා, ඔහුගේ දියනියන් දෙදෙනාගේ මරන හා, ස්ටැලින්වාදී තන්ත්‍රය විසින් ඔහුගේ පියාට කරන ලද වධ හිංසා අතර සම්බන්ධයක් තිබුනි.

1940 අගෝස්තු මාසයේදී සෝවියට් ඒජන්තයෙකු විසින් ට්‍රොට්ස්කි මරාදමන ලදී. ඒ වන විට දෙවන ලෝක සංග්‍රාමය ඇරඹී තිබුනි. 1939 අපකීර්තිමත් ස්ටැලින් හිට්ලර් ගිවිසුම ලේ ගංගාවකින් අවසානයකට ගෙන එමින්, 1941 වසරේ ජූනි මාසයේදී නාසීන් විසින් සෝවියට් සංගමය ආක්‍රමනය කිරීමෙන් පසුව, ඇමරිකානු හා බටහිර යුරෝපීය බුද්ධිමත්තු, ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයට එරෙහිව ස්ටැලින් විසින් කරන ලද අප්‍රමාන සැහැසිකම් ඉස්මතු කිරීමට තරම් යෝග්‍ය මනසිකත්වයක නොසිටියහ. රූස්වෙල්ට් පාලනාධිකාරයේ දිරිගැන්වීම මත හා එක්සත් ජනපද තානාපති ජෝසෆ් ඩේවිස්ගේ පිලිකුල් සහගත විස්තරයට අනුව *Mission to Moscow* (මොස්කව් කරා දූත මෙහෙවර) නමින් මොස්කව් නඩු විභාග අලලා ස්ටැලින්ට පක්ෂපාතී චිත්‍රපටියක් හොලිවුඩ්හි නිපදවන ලදී. එම චිත්‍රපටියෙන් ට්‍රොට්ස්කි පිලිබිඹු කලේ සෝවියට් ජනතාවගේ සතුරෙකු ලෙසිනි.

දෙවන ලෝක සංග්‍රාමයෙන් ඉක්බිත්තෙහි ඇරඹුනු සීතල යුද්ධය, ස්ටැලින් කෙරෙහි, විශේෂයෙන්ම එක්සත් ජනපදයේ බුද්ධිමතුන් අතර පැවති උද්යෝගය හීන කලේය. එහෙත් ට්‍රොට්ස්කිගේ ප්‍රධාන ඓතිහාසික හා දේශපාලන නියෝජනය ඒ වන විට පසුබිම තුලට මැකීගොස් තිබුනි. 1953 මාර්තු මාසයේ සිදුවූ ස්ටැලින්ගේ මරනය, නිලධාරි තන්ත්‍රයේ දිග් ගැසුනු අර්බුදය හා මරලතෝනියේ ආරම්භය සනිටුහන් කලේය. 1956 වසරේ කෲෂෙව් ගේ රහස් දේශනය, ස්ටැලින් සමූහ ඝාතකයෙකු ලෙස එලිදරව් කලේය. මේවන විට ඩොයිස්චර්ගේ පලමුවෙනි වෙලුම පලකොට තිබුනි. ස්ටැලින්ගේ ක්ෂමා විරහිත විරුද්ධවාදියාගේ ජීවිතය පිලිබඳව යලි උනන්දුව දැල්වීමට මෙය, ඉමහත් ලෙස දායක විය. දෙවන වෙලුම 1959 ද තෙවන වෙලුම 1963 වසරේදී ද එලිදැක්වුනි. මේ වනවිට තරුන දේශපාලන පෙරලිකාරිත්වය ආරම්භ වී තිබුනි. ඩොයිස්චර්ගේ තුන් ඈඳිය කියවීම යුගාත්මක අත්දැකීමක් විය.

මේ අවස්ථාවේදී මගේම අත්දැකීම ගැන මා කථාකල යුතුය. 1969 නොවැම්බර් මාසයේ මා සිටියේ වොෂින්ටනයේය. වියට්නාම් යුද්ධයට එරෙහිව ජනතා පෙලපාලියක් කැඳවා තිබුනි. ඩිමොක්‍රටික් පක්ෂය, අධිරාජ්‍යවාදය කෙරේ, සමාජවාදී කෙසේ වෙතත්, ප්‍රගතිශීලී විරෝධයක් නියෝජනය කරන්නේ යයි මා

තුල කලින් පැවති අපේක්ෂාවේ කිසිවක් මේ වන විට ඉතිරිව තිබුනේ නැත. එම මහජන පෙලපාලියේ මුවවිටදී ධවල මන්දිරය ඉදිරියේ පැවති පෙලපාලියක් මට දැකගන්නට ලැබුනි. දල්වාගත් ඉටිපන්දම් සහිතව පෙලපාලිකරුවෝ ජනාධිපති නිවහන වටා ගමන් ගත්හ. මෙම දර්ශනය අතිශයින්ම නිරර්ථක යයි මට හැඟුනි. ඉටිපන්දම් වලින් නික්සන්ගේ හෘද සාක්ෂිය අවදි කරනු ඇතැයි විරෝධතා කරුවන් සැබවින්ම විශ්වාස කලා ද?

ධවල මන්දිරයෙන් එහා පැත්තේ පෙන්සිල්වේනියානු මාවතේ පොත්හලක් තිබෙනු දුටුවෙමි. එහි තිබූ එක් පොතක් මාගේ අවධානයට ලක් විය. නාසයේ රඳවාගත් උපැස් යුවලක් තුලින් ආත්ම විශ්වාසයෙන් බලා සිටින තරුනයෙකුගේ ඡායාරූපයකින් එහි පිට කවරය සැරසී තිබුනි. එහි නම *The Prophet Armed* (සන්නද්ධ අනාගතවක්තෘ) විය. පොත මිලට ගත් මම එදින රාත්‍රියේම එය කියවීමට පටන් ගත්තෙමි. එය කියවා අවසන් වන තෙක්ම පසෙකින් තැබීමට මැලිවීමි. එය, ලියොන් ට්‍රොට්ස්කිගේ ජීවිතය හා අදහස් සමඟ ජීවිත කාලයක බැඳීමක් බවට පත්වීමේ ආරම්භය විය.

ඩොයිස්චර්ගේ චරිතාපදානයෙහි බලය රැඳී තිබුනේ කොතැනක ද? ඩොයිස්චර් අති දක්ෂ ලේඛකයෙකු වූ බව අවිවාදිතය. ඉංග්‍රීසි භාෂාව හැසිරවීමෙහිලා ඔහුට පැවති හැකියාව සිහිගන්වන්නේ, ඔහු හා සමවාසිකයෙකුවූ විශිෂ්ඨ ලේඛක ජෝසෆ් කොන්රඩ්ය. එනමුදු, ඩොයිස්චර්ගේ ඉමහත් කාර්ය සිද්ධිය වූයේ, ඓතිහාසික වාර්තාව පදනම් කරගෙන ලේඛකයෙකු, කලාවේදියෙකු, දේශකයෙකු, හමුදා නායකයෙකු, දේශපාලන මූලෝපායඥයෙකු, සමාජවාදී චින්තකයෙකු හා සත්තකින්ම, මනුෂ්‍යයෙකු ද වශයෙන් ට්‍රොට්ස්කිගේ බලගතු විප්ලවකාරී පෞරුෂය ඔහු විසින් ප්‍රතිනිර්මානය කර තිබීම ය. ඔක්තෝබර් විප්ලවයේ නාටකය හා ඛේදාන්තය ද එහි ශ්‍රේෂ්ඨතම පුද්ගලයාගේ ජීවිතය තුල එහි පිලිබිඹුව ද ඩොයිස්චර්ගේ චරිතාපදානයේ පිටු අතර බලගතු ප්‍රකාශනය අත්කර ගත්තේය, කෙසේ වෙතත් අප යෙදී සිටින්නේ චරිතාපදානය පිලිබඳ අවිවේචනාත්මක ව්‍යායාමයක යයි විස්තර කිරීම බරපතල ව්‍යාජයක් වනු ඇත. ඇත්ත වශයෙන්ම ඩොයිස්චර්ගේ චරිතාපදානයේ සැලකිය යුතු කොටසක්, විශේෂයෙන්ම එහි අවසන් වෙලුම, කැපකර ඇත්තේ ට්‍රොට්ස්කිගේ දේශපාලන ඉදිරිදර්ශනයේ බොහෝ තීරනාත්මක අංශ සමඟ කතුවරයාගේ ගැඹුරු හා නොවෙනස් කල හැකි දේශපාලන මතභේද වඩ වඩාත් අවධාරනය කෙරෙන අනාවරනයකට ය.

ඩොයිස්චර්ගේ විවේචන එසේ තිබියදී වුවත්, ට්‍රොට්ස්කිගේ දැවැන්ත හා චිරකාලීන ඓතිහාසික වැදගත්කම පිලිබඳව පාඨකයා තුල සැක මතුවීමට ඔහු ඉඩක් නොතැබීය. රුසියානු විප්ලවය, විසිවන සියවස හා ඉන් ඔබ්බට, මානව වර්ගයාගේ ඓතිහාසික ඉරනම අවබෝධ කර ගැනීමට කැමැත්තක් දැක්වූ අයට, ලියොන් ට්‍රොට්ස්කිගේ අදහස් සමඟ පොරබැදීම අනිවාර්ය විය. සිය ශ්‍රේෂ්ඨ කෘතිය අවසානයේදී ඩොයිස්චර්, ට්‍රොට්ස්කිගේ ජීවිතය වඩාත් යහපත් හා වඩාත් මානවවාදී ලෝකයක් එනම්, රුසියානු විප්ලවය අනුප්‍රානය කල ශ්‍රේෂ්ඨ පරමාදර්ශ අවසාන වශයෙන් සාක්ෂාත් කරගත හැකි ලෝකයක පෙර නිමිත්තක්, නිරූපනය කලේය යන දැඩි විශ්වාසය සිය පාඨකයන් වෙත ඉතිරිකොට තැබුවේය.

තම ජීවිත කාලය තුල ප්‍රතිගාමීත්වයේ ඉමහත් බලයෙන් යටපත් කරනු ලැබුව ද ඔහුගේ පරමාදර්ශයන්හි අවසන් ජයග්‍රහනය තුලින් සනාථනය අත්කරගනු ඇති, ප්‍රොමිතියානු (ග්‍රීක ධර්මයට අනුව අග්නි දෙවියන් හා ටයිටන් වරයෙකුගේ එනම්, ග්‍රීක පුරාවෘත්තයට අනුව යුරේනස් හා ගේඉයා ගේ දරු මුනුබුරු පරම්පරාවේ අයෙක්) දේහකායක් ලෙස ඔහු ට්‍රොට්ස්කි අවබෝධකර ගත්තේය. ෂෙලී ගේ ප්‍රොමිතියස් අන්බවුන්ඩ් (නිර්බන්ධිත ප්‍රොමිතියස්) කෘතියේ අවසන් කවිය උපුටා දක්වමින් ඩොයිස්චර් සිය චරිතාපදානය නිම කලේය.

සර්වබලධාරී යයි පෙනෙන බලයට, එරෙහිව
නැගී සිට;
අපේක්ෂාව සිය සුන්බුන් තුලින්
එහි අරමුන සාධා ගන්නා තුරු;
ආදරය කරන්නට, දරා සිටින්නට;
නොවෙනස්ව, නොපැකිල, නොපසුතැවුල්ව
සිටින්නට;
මෙය නම් රජුනි හිරුදෙව්,
ඔබ උද්දීප්තිය සේම යහපත්ය, ශ්‍රේෂ්ඨය, ප්‍රීතිමත්ය,
නිදහසය
මෙයම වෙයි ජීවිතය, අධිරාජ්‍යය සහ විජයග්‍රහනය;

ට්‍රොට්ස්කිගේ ජීවිතයට හා ඓතිහාසික භූමිකාවට මෙතරම් උචිත වන, මේ උදාර මනෝභාවයන් ඉදිරියේ, පහත් හා ද්වේෂයෙන් කුලුගැන්වුන මහාචාර්ය සර්විස්ගේ කෘතියෙන් ඉතිරි කෙරෙන්නේ කුමක් ද?


© www.wsws.org